ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 1 වන මට්ටම
අවසාන පරීක්ෂණය
ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසය - SSF 1301
අධ්‍යයන වර්ෂය - 2006

කාලය : පැය තුනයි (03)

දිනය : 2006.11.19 වේලාව : පෙ.ව. 9.00 - මධ්‍යාහ්න. 12.00

එක් කොටසකින් අවම වශයෙන් එක් (01) ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ)

පළමුවන කොටස

1. පුනරුදය යුරෝපයේ ආගමික හා සංස්කෘතික ප්‍රතිසංස්කරණවලට තුඩුදුන් ආකාරය සාකච්ඡා කරන්න.

2. කන්ද උඩරට රාජධානියේ පැවති කුල ක්‍රමය සහ ඉඩම් බුක්ති ක්‍රමය පිළිබඳ රචනයක් ලියන්න.

3. ශ්‍රී ලංකාව තුල ලන්දේසි පාලනයේ බලපෑම් පිළිබඳ විස්තරයක් ලියන්න.

දෙවන කොටස

4. "ඉංග්‍රීසි පෙරදිග ඉන්දිය වෙළඳ සමාගම විසින් පවත්වාගෙන යනු ලැබූ ද්විත්ව පාලන ක්‍රමය අසාර්ථක විය." සාකච්ඡා කරන්න.

5. බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වාදෙන ලද කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණයන්හි සුවිශේෂතා සාකච්ඡා කරන්න.

6. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (අ) 1818 කැරැල්ල (ඇ) 1833 කර්මාන්තශාලා පනත
   (ආ) බෙන්තම් සහ උපයෝගිතා වාදය (ඈ) 1840 මුඩුබිම් පනත

තුන්වන කොටස

7. යටත්විජිතවාදී පාලන ක්‍රමය යටතේ 1850 පසුව වාරිමාර්ග කටයුතු යලි නගා සිටුවීමට හේතුවූ කරුණු මොනවාද? ඒවා පිළිබඳ විස්තරයක් කරන්න.

8. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන දියුණුව නිසා ඇතිවූ සමාජයිය සහ ආර්ථික බලපෑම් විස්තර කරන්න.

9. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (අ) රාජ්‍ය නිර්බාධවාදය (ආ) 1848 අංක 8 දරන මහාමාර්ග පනත
   (ඇ) ධාන්‍ය බද්ද

***** සියලුම හිමිකම් ඇවිරිණි *****